**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජනවාරි 2021

## (302) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
(Management Accounting and Finance)

---

**සමස්ත විග්‍රහය:**

මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 100 ක් ආවරණය කරමින් කොටස් 3 කින් සමන්විත විය.

1. එකකට ලකුණු 5 බැගින් ලකුණු 20 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න 4 ක්, **A කොටසේ** ඇතුළත්ය.
2. එකකට ලකුණු 10 බැගින් ලකුණු 30 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න 3 ක්, **B කොටසේ** ඇතුළත්ය.
3. එකකට ලකුණු 15 ක්, ලකුණු 10 ක් සහ ලකුණු 25 ක් බැගින් ලකුණු 50 ක් සඳහා වූ අනිවාර්ය ප්‍රශ්න 3 ක්, **C කොටසේ** ඇතුළත්ය.

**පොදු නිරීක්ෂණ:**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. කෙසේවෙතත්, පොදු වැරදි කීපයක් නිරීක්ෂණය විය.

**කොටස් අනුව කාර්යසාධනය:**

ලකුණ 20 ක් සඳහා වූ ප්‍රශ්න 4 කින් **A කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්ය සාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | සතුටුදායකයි |
| 2 | සාමාන්‍යයයි |
| 3 | සතුටුදායකයි |
| 4 | සතුටුදායකයි |

ලකුණ 30 ක් සඳහා වූ ප්‍රශ්න 3 කින් **B කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා ද අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්ය සාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | සතුටුදායකයි |
| 2 | සතුටුදායකයි |
| 3 | සාමාන්‍යයයි |

ලකුණ 20 ක් සඳහා වූ ප්‍රශ්න 4 කින් **C කොටස** සමන්විත විය. මෙම කොටස සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය. ප්‍රශ්න අනුව මෙම කොටසේ උත්තර ලිවීමේ කාර්ය සාධනය පහත පරිදි විය:

| ප්‍රශ්න අංකය | කාර්යසාධන ඇගයීම |
|---|---|
| 1 | දුර්වලයි |
| 2 | සතුටුදායකයි |
| 3 | අසතුටුදායකයි |

# A කොටස

## ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** කලමනාකරණ ගිනුම්කරණය හා මූල්‍ය ගිණුම්කරණය අතර වෙනස්කම් 2ක් හඳුනා ගැනීම අවශ්‍යකරන ලදී. මෙම ප්‍රශ්නය සඳහා සිසුන්ගේ කාර්යසාධනය ඉහළ මට්ටමක පැවතුණි.

මෙම ප්‍රශ්නයේ **(b) කොටසින්** ලාභ සමච්ඡේදන ලක්ෂය ගණනය කිරීම සහ අයවැයගත විකුණුම් ප්‍රමාණයේදී අපේක්ෂිත ලාභය ගණනය කිරීම අවශ්‍ය කරන ලදී. මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් සිසුන් නිවැරදි පිළිතුර සපයා තිබුණි. කෙසේ වෙතත් සමහර අයදුම්කරුවන් අපේක්ෂිත ලාභය වෙනුවට ආන්තිකය ගණනය කර තිබුණි.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නයේ (a) සහ (b) කොටස් සඳහා උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සතුටුදායක විය.

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්න පත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව-අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.

## ප්‍රශ්න අංක 02

කාරක ප්‍රාග්ධන චක්‍රය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නය තුළින් පරීක්ෂා කරන ලදී. සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදි අසාර්ථක වී තිබුණි.

**පොදු වැරදි:**

බහුතරයක් අයදුම්කරුවන් 20% ක් වූ දළ ලාභ අනුපාතිකය යොදාගෙන ලාභය ගණනය කිරීමට අපොහොසත් වී ඇත. තවද සමහරක් සිසුන් විකුණුම් වල අගය 120 ක් ලෙස ගෙන වැරදි දළ ලාභයක් ගණනය කර තිබුණි.

ලබාදී ඇති ආරම්භක හා අවසාන තොගයන් වල අගයන් අනුසාරයෙන් ගැනුම් වට්නාකම සෙවීමට සමහරක් අයදුම්කරුවන් අපොහොසත් වී තිබිණි.

තොග පිරිවැටුම් අනුපාත හා ණය හිමි ගෙවීමේ කාලය ගණනය කිරීමේදී සාමාන්‍ය තොග වටිනාකම සහ සාමාන්‍ය ණය හිමි වටිනාකම සැලකිල්ලට ගෙන නොතිබුණි. සුළුතර අයදුම්කරුවන් ප්‍රමාණයක් කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කිරීමේදී තොගයේ සහ ණය හිමියන්ගේ සාමාන්‍ය අගය සැලකිල්ලට ගෙන නොතිබුණි. කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කිරීමේදී මෙම සාමාන්‍ය වටිනාකම් සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් වේ.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්නවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් නම්‍ය අයවැය සංකල්පය පිළිබඳ අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කරන ලදී. මෙහිදී අයවැයගත සහ සත්‍ය මෙහෙයුම් ප්‍රකාශනය ලබා දී තිබූ අතර ඒ ඇසුරෙන් නම්‍ය අයවැය ප්‍රකාශනයක් පිළියෙල කිරීම අවශ්‍ය විය. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**පොදු වැරදි:**

සමහරක් අයම්කරුවන් නම්‍ය අයවැය ප්‍රකාශය පිළියෙල කල ද අයවැය ගත අගයන් හා සත්‍ය අගයන් අතර විචල්‍යතාවය පෙන්නුම් කර නොතිබුණි.

තවද සමහරක් අයදුම්කරුවන් විසින් ස්ථාවර පිරිවැයන් නිෂ්පාදන ඒකක ප්‍රමාණය පදනම් කරගෙන බෙදා වෙන්කර තිබුණි.

**කාර්යසාධනය:** සතුටුදායකයි.

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්නපත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.
- සියළුම පෙර වැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
- උත්තර ලිවීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කර ගත යුතුය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයෙහි දී ඇති තොරතුරුවලට අදාල ඇනවුම පිළිගත යුතුදැයි තක්සේරුවක් සිදු කිරීම අවශ්‍ය විය. බහුතර අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතා හොඳ මට්ටමක පැවතුණි.

**පොදු වැරදි:**

- මෙම ඇනවුම ලැබීමට පෙර වැය කරන ලද පර්යේෂණ උපදේශන ගාස්තුව වූ රු. 450,000 ක මුදල ගිලුණු පිරිවැයක් ලෙස හඳුනා ගත යුතුය. එබැවින් අදාල ඇනවුම පිළිගන්නේද යන්න තීරණය කිරීම සඳහා මෙම පිරිවැය අදාල නොවේ. සමහර අයදුම්කරුවන් මෙය ගිලුණු පිරිවැයක් ලෙස හඳුනාගෙන එය නව ඇණවුමේ පිරිවැයක් ලෙස නොසලකා නිවැරව ගණනය කිරිම් දක්වා තිබුණි. තවද, සමහරක් අයදුම්කරුවන් මෙම පිරිවැය නොසලකා තිබුණත් එය ගිලුණු පිරිවැයක් ලෙස දක්වා නොතිබුණි.
- සමහර අයදුම්කරුවන් බාහිර ශ්‍රමය ගණනය කර නොතිබුණි. ප්‍රශ්නයේ දී තිබුණු තොරතුරු අනුව බාහිර ශ්‍රමය, අභ්‍යන්තර ශ්‍රමයට වඩා ලාභ දායී වේ. එම නිසා, ශ්‍රමය බාහිරින් ලබා ගත යුතු බව සිසුවා විසින් නිර්දේශ කළ යුතුව තිබිණි.
- අයදුම්කරුවන් කිහිප දෙනෙකු රු.මිලියන 1.25 ක ආවස්ථික පිරිවැය හඳුනා ගැනිමට අපොහොසත් වී තිබුණි. ආවස්ථික පිරිවැය ලෙස නව ඇනවුම භාර ගැනීම නිසා අහිමි වූ පවතින නිශ්පාදනයේ ලාභය සැලකිල්ලට ගත යුතුව තිබිණි.

**කාර්යසාධනය:** සතුටුදායකයි.

**පරීක්ෂක යෝජනා:**

- අයදුම්කරුවන් විසින් ඔවුන් විසින් ළඟා කරගත් තීරණය නිසි පරිදි සඳහන් කළ යුතුය.
- පෙර ප්‍රශ්නපත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.

## B කොටස

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මගින් දී ඇති තොරතුරු යොදාගෙන 2021 අප්‍රේල්, මැයි, ජූනි මාසයන් සඳහා මුදල් අයවැය පිළියෙල කිරීම පරීක්ෂා කර තිබුණි. සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය සඳහා නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**පොදු වැරදි:**

- ඇසුරුම් හා බෙදා හැරීමේ වියදම් එම වියදම සිදුවූ මාසයේම දක්වා තිබුණි. මෙහිදී දින 60 ක ණය කාලය නොසලකා අය වැය ප්‍රකාශනය පිළියෙල කර තිබුණි.
- විදුලිය, ජලය හා දුරකතන වියදම් එම වියදම සිදුකළ මාසයේ නොව ඊට පසු මාසයේ දැක්විය යුතුව තිබුණි.
- මාසික කුළිය වූ රු 50,000/- ක මුදල ගෙවනු ලබන්නේ කාර්තුමය පදනමින් බැවින් එය කාර්තුව අවසන් වී එළඹෙන මාසයේ අයවැය ප්‍රකාශනය තුළ දැක්විය යුතුය. නමුත් සමහරක් අයදුම්කරුවන් මාසික කුළිය ඊට පසු මාසයේ අයවැය ප්‍රකාශනයේ දක්වා තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිපත් කිරීමට අදාල ආකෘතිය අනුගමනය කර නොතිබුණි. තවද ආරම්භක හා අවසාන මුදල් ශේෂයන් පැහැදිලිව පෙන්වා නොතිබුණි.

**කාර්යසාධනය:** සතුටුදායකයි.

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්න පත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව-අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.
- සියළුම පෙර වැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
- උත්තර ලිවීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්නය හොඳින් කියවා අවබෝධ කර ගත යුතුය.

## ප්‍රශ්න අංක 06

සමාගමක සීමාකාරී සාධකයක් පවත්නා විට ප්‍රශස්ථ නිශ්පාදන මිශ්‍රණය ගණනය කරන්නේ කෙසේ දැයි මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර ඇත.

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** සීමාකාරී සාධක හඳුනා ගැනීමද **(b) කොටසින්** හඳුනාගත් සීමාකාරි සාධක ඇසුරින් ප්‍රශස්ථ නිශ්පාදන මිශ්‍රය ගණනය කිරීමද අවශ්‍යව තිබුණි. බහුතර අයදුම්කරුවන් පිරිසක් මෙම ප්‍රශ්නය සඳහා හොඳින් පිළිතුරු සපයා තිබුණි.

**පොදු වැරදි:**

- මෙම ප්‍රශ්නයෙහි **(a) කොටසින්** සීමාකාරී සාධකය හෝ සාධක හඳුනා ගැනීම අවශ්‍ය කර තිබුණත් බහුතරයක් අයදුම්කරුවන් සීමාකාරී සාධකය ලෙස පුහුණු ශ්‍රමය B ශ්‍රේණිය හඳුනා ගැනීමෙන් අනතුරුව නුපුහුණු ශ්‍රමය සීමාකාරී සාධකයක් වන්නේද නොවන්නේ ද යන්න පරීක්ෂාකර නොතිබුණි.
- දායකය ගණනය කිරීමේදී ඍජු අමු ද්‍රව්‍ය විචල්‍ය පිරිවැයක් ලෙස සලකා නොතිබුණි.

**කාර්යසාධනය:** සතුටුදායකයි

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්නපත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- අයදුම්කරුවන් විසින් සීමාකාරී සාධක පිළිබඳ දැනුම වැඩි දියුණු කර ගත යුතුය.

## ප්‍රශ්න අංක 07

පොදු සමාගමක සාමාන්‍ය කොටස් පිරිවැය නිදහස් කළ නොහැකි වරණීය කොටස පිරිවැය, නිදහස් කළ හැකි ණයකර පිරිවැය,වෙළඳ පොළ අගය භාවිතයෙන් බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (WACC) ගණනය කිරීමට අයදුම්කරුවන්ගේ ඇති හැකියාව මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකරන ලදී. බහුතර අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය කොටස් පිරිවැය හා නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණි. නමුත් නිදහස් කළහැකි ණයකර පිරිවැය හා වෙළඳ පොළ අගය භාවිතයෙන් බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීමේ කාර්යසාධනය ඉතා දුර්වල විය.

**පොදු වැරදි:**

- නිදහස් කළ හැකි ණයකර පිරිවැය ගණනය කිරීමේදී අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාත පිළිබඳ සිසුන්ගේ දැනුම දුර්වල බව පෙනුණි.
- බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධනය ගණනය කිරිමට වෙලඳපොල මිල පදනම් කරගෙන නොතිබුණි.
- ප්‍රාග්ධන පිරිවැය ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කර නොතිබුණි.

**කාර්යසාධනය:** සාමාන්‍යයයි.

**පරීක්ෂක හෝජනා:**

- පෙර ප්‍රශ්නපත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සාමාන්‍ය කොටස් පිරිවැය, නිදහස් කළ නොහැකි වරණීය කොටස් පිරිවැය, නිදහස් කළ හැකි ණයකර පිරිවැය ගණනය කිරීම්වලට අදාල නිවැරදි සූත්‍ර පිළිබඳ මනා දැනුමක් හා එම සූත්‍ර යොදාගෙන ගණනය කිරීම් කරන ආකාරය පිළිබඳ මනා පුහුණුවක් ලබා ගත යුතුය.

## C කොටස

### ප්‍රශ්න අංක **08**

විචල්‍යතා විශ්ලේෂණය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂා කරන ලදී. ඒ අනුව භාවිතාකළ සෘජු ද්‍රව්‍ය ප්‍රමාණය, සෘජු ශ්‍රම මිශ්‍රණ විචලනය සෘජු ශ්‍රම ඵලදායීතා විචලන සහ මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙල කිරීම අවශ්‍ය විය. බහුතර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සාහ කර නොතිබුණි.

**පොදු වැරදි:**

ප්‍රමිත පිරිවැය සහ විචල්‍යතා විශ්ලේෂණ සංකල්ප පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අයදුකම්රුවන් සතුව නොතිබු බව නිරීක්ෂණය විය.

බහුතර අයදුම්කරුවන් සංඛ්‍යාවක් භාවිත කළ සෘජු ද්‍රව්‍ය ප්‍රමාණය නිවැරව ගණනය කර නොතිබුණි. මෙම ප්‍රශ්නය තුළ සෘජු ද්‍රව්‍ය විචලනය ලබා දී තිබුණු අතර නිවැරදි සූත්‍රය භාවිතා කර සත්‍ය සෘජු ද්‍රව්‍ය ප්‍රමාණය පහසුවෙන් ගණනය කළහැකිව තිබිණි.

බහුතර අයදුම්කරුවන්ට මිශ්‍රණ හා ඵලදායීතා විචලන ගණනය කිරීමේ අපහසුතා මතු වූ බවට නිරීක්ෂණය විය.

**කාර්යසාධනය:** දුර්වලයි.

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්නපත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.
- සියළුම පෙර වැඩ නිසි පරිදි පැහැදිලිව පෙන්විය යුතුය.

### ප්‍රශ්න අංක **09**

ශුද්ධ වර්තමාන අගය (NPV) භාවිත කරමින් නව ව්‍යාපෘතියක් ඇගයිම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂාකර තිබේ. තවද ගණනය කළ ශුද්ධ වර්තමාන අගය භාවිත කර ව්‍යාපෘතියේ ශක්‍යතාවය තක්සේරු කිරීමද අවශ්‍ය විය. බහුතර අයදුම්කරුවන් සංඛ්‍යාවක් මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**පොදු වැරදි:**

- සමහර අයදුම්කරුවන් විසින් පරීක්ෂණ ගණන සඳහා වූ ඉල්ලුම් ප්‍රමාණය මුළු ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.
- සමහර අයදුම්කරුවන් ඒකකයක විකුණුම් මිල, සෘජු ද්‍රව්‍ය පිරිවැය ,සෘජු ශ්‍රම පිරිවැය සහ විචල්‍ය පොදු කාර්යය පිරිවැය යොදා ගෙන ශුද්ධ වර්තමාන අගය ගණනය කර තිබුණි. එම අගයන් පරීක්ෂණ ගණන සඳහාවූ ඉල්ලුම් ප්‍රමාණයෙන් ගණනය කිරීම සිදුකර නොතිබුණි.
- බහුතර අයදුම්කරුවන් ස්ථාවර පිරිවැය ලෙස රු. මිලියන 30 ක් පමණක් සලකා තිබුණු අතර ක්ෂය වීම රු. මිලියන 24 නොසලකා හැර තිබුණි.
- සමහරක් සිසුන් බදු සඳහා වු ලාභය ගණනය කිරීමේදී රු. මිලියන 30 ක් වු ප්‍රාග්ධන දීමනාව අවුරුදු 5 ටම අදාලව ශුද්ධ මුදල් ප්‍රවාහයෙන් අඩු කොට දක්වා ඇත.

**කාර්ය සාධනය:** සතුටුදායකයි.

**පරීක්ෂක භෝජනා:**

- පෙර ප්‍රශ්නවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව-අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.
- සියළුම පෙර වැඩ නිසි පරිදි පැහැදිලිව පෙන්විය යුතුය.

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** පෙරසැරි පිරිවැය කරණය පිළිබඳ දැනුම පරීක්ෂාකර තිබේ. එහිදී සමානුපාතික ඒකක පිරිවැය දැක්වෙන ප්‍රකාශනය හා **පෙරසැරි I** ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය විය. බහුතර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට හොඳින් පිළිතුරු සපයා තිබුණි. සුළු අයදුම්කරුවන් ප්‍රමාණයක් සමානුපාතික ඒකක හා පිරිවැය ප්‍රකාශනය මෙන්ම **පෙරසැරි I** ගිණුම පිළියෙල කිරීමේ අපහසුතාවන් පෙන්නුම්කරන ලදී. විශේෂයෙන්ම අවසාන නොනිමි තොග ගණනය කිරීමට අදාල සමානුපාතික ඒකක ගණන ගණනය කිරීමේදී දුර්වලතාවන් පෙන්නුම් කරන ලදී. තවද, සමහර අයදුම්කරුවන් අසාමාන්‍ය අපතයට අදාල සමානුපාතික ඒකක ගණන හා සාමාන්‍ය අලාභයේ වටිනාකම සැලකිල්ලට ගෙන නොතිබුණි.

මෙම ප්‍රශ්නයේ **(b) කොටස** මගින් තීරණ ගැනීමට අදාල රුක් සටහන් න්‍යාය පරීක්ෂා කර තිබුණි. බහුතර අයදුම්කරුවන් රුක් සටහන නිවැරදිව සහ පැහැදිලිව ඇඳ දක්වා නොතිබුණි තවද බහුතරයක් සිසුන් ඔවුන්ගේ පෙර වැඩ පැහැදිලිව දක්වා නොතිබුණි.

**කාර්ය සාධනය:** සතුටුදායක නැත.

**පරීක්ෂක යෝජනා:**

- පෙර ප්‍රශ්න පත්‍රවල මීට සමාන ආකාරයේ ප්‍රශ්න වැඩිපුර තෝරා උත්තර ලියා පුරුදු පුහුණු වීම.
- සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනිමට ස්ව-අධ්‍යයන පොත් අධ්‍යයනය කිරීම.
- සියළුම පෙර වැඩ නිසි පරිදි පැහැදිලිව පෙන්විය යුතුය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මඟින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -